සියලුම හිමිකම් ඇවිරිණි/All Rights Reserved/முழுப் பதிப்புரிமையுடையது

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලා Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampa පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Educat පන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha ගම්පහ අධ්‍යාපන

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

දෙවන වාර ඇගයීම - **2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 11 | විෂයය Subject: සිංහල සාහිත්‍යය III | කාලය Time: පැය 2 |

නම-.................................................................................................... පන්තිය-...................

1.(i) සිට (x) තෙක් සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර සපයන්න.කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් ,එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. ''පුත , එයින් මට කියා ද ගන්නේ ? ඇර ගන්ව''

(අ) මෙසේ, ලබා ගන්නැ'යි පැවසුවේ කුමක් ද?

(ආ) මෙහි, 'පුත' යනුවෙන් අමතන්නේ කාහට ද?

ii. '' වහන්සෙ, ඇප් උන් වඳම්හ.දුටු කලැ හුනස්නෙන් නැඟෙම්හ.හිඳුනා අසුන් දෙම්හ.සතර පසයෙන් උපස්ථාන කෙරෙම්හ ''යි කීයැ.

(අ) මෙසේ පැවසුවේ කවුරුන් ද?

(ආ) මෙම පාඨය උපුටා ගත් ග්‍රන්ථයේ නම කුමක් ද?

iii. පහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
ඇසෙයි ළමා වසුපැටියන් හඬ දුරට

(අ)..........................................................................................

(ආ)..........................................................................................

iv. '' ආ, එහෙනම් අපට බෑ මෙහිදී මොකුත් කියන්ඩ.උඹ කඹුරුපිටියට ගිහින් ඒජන්ත හාමුදුරුවන්ට පෙත්සමක් දීපන්. ''

(අ) මෙලෙස පැවසුවේ කවුරුන් ද?

(ආ) මෙම පාඨය උපුටා ගත් ග්‍රන්ථයේ මුල් කතුවරයාගේ නම කුමක් ද?

v. හේනේ පැලේ මා විඳිනා **සුරැක්කන්**

ඌරෝ ඇවිත් වට පිට කරති සක්මන්

වැටටත් උඩින් උන් අල්ලන මලක්කන්

..............................................................................

(අ) මෙහි සිව් වන පදය සම්පූර්ණ කරන්න.

(ආ) තද කළු අකුරින් දැක්වෙන වචනයේ අදහස කුමක් ද?

vi. '' උග්ගසේන නම් සිටුපුත්‍රයාට ශිල්ප දක්වන්ට කියව ''

(අ) මෙම ප්‍රකාශය සිදු කළේ කාහට ද?

(ආ) සද්ධර්මරත්නාවලිය රචනා වූයේ කිනම් රජ දවස ද ?

vii. (අ) 'සියබස්ලකර' කෘතිය කුමන අලංකාර ග්‍රන්ථයේ අනුවාදයක් ද ?

(ආ) ' ධර්ම ප්‍රදීපිකාව ' ග්‍රන්ථයේ කතුවරයා කවුරුන් ද ?

viii. (අ) එච්.එම්.කුඩලිගම කවියාට සමකාලීන කවියෙක් නම් කරන්න ?

(ආ) කුඩලිගම කවියා හැඳින් වූ අන්වර්ථ නාමය කුමක් ද?

ix. (අ) 'සිංහබාහු' නාට්‍යයේ නිර්මාණකරු කවුරුන් ද ?

(ආ) 'සිංහබාහු' නාට්‍ය කිනම් නාට්‍ය සම්ප්‍රදායට අයත් ද ?

x. එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා

වෙන් උන දාට යක් දෙබරේ වද සේමා

ගොසින් ගොසින් කටු අත්තේ අග සේමා

ඉතින් ළඳේ කරිවිල තිබ්බටු සේමා

(අ) මෙම කවියේ ශබ්ද රසය ඇති කිරීමට භාවිත කර ඇති කාව්‍ය උපක්‍රමයක් ලියන්න.

(ආ) මෙම කවි අයත් ජන කවි වර්ගය කුමක් ද?

(ලකුණු 2× **10**=20 )

02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.

1. 'එක් සියයක් රජ දරුවන් මරන පිණිස **ශෘංගී ලා** ඉදි කරන ලද මෙබඳු සුරා පානය මහෞෂධ පණ්ඩිතයන් විසින් බාධා කෙළේ යැ 'යි **කිපියේ ය.**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) එක් සියයක් රජ දරුවන් මැරීමේ සතර කන්මන්ත්‍රණය කෙටියෙන් විස්තර කරන්න ?

2. **අයි රාවණ** වුවත් නවතන රිසින් එන

**අයි රා දහස්** දිලි දුනු කොත් සිපත් ගෙන

කයි කාවලෙහි දැකැ සෙබළුන් රැක සිටින

වයි යා කරන් මල් තුරු ගන වන හිසින

(අ) මෙහි තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

3. පුරුදු පරිදි වනයෙන් සොයාගෙන නෙක් ගොදු රු

**මිගිදා** එයි **සතොසින්** නොදැන වූ සේ නපු රු

දැක ගල පසෙක වැටී ලෙන හිස්ව තිබී අයු රු

දැඩි සොවින් ගොස නගා වන පෙත කරයි දැදු රු

(අ) කවියේ තද කළු අකුරින් දැක්වෙන වචනවල අර්ථය ලියන්න.

(ආ) කවියේ අදහස ලිහිල් බසින් ලියන්න.

4. '' ඉදින් මහරජ ,තො අඟුල්මල්හු කෙහෙ බහා සිවුරු හැඳැ පෙරෙවැ පැවිජි වැ **පණිවා** ඈ පව්කැමින් විරත වැ එක් වෙලෙ වළඳා **බඹසරවස්** රැකැ සිල්වත් වැ කලණදහම් පුරා වසන්නහු දිටිහි නම් ,උහුට කුමක් කෙරෙහි ? යි වදාළහැ.

(අ) ඉහත පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත වචනවල අදහස වෙන වෙන ම ලියන්න.

(ආ) ඉහත දැක්වෙන උද්ධෘතයේ අර්ථය සරල බසින් ලියන්න.

5. දන් දුන් උපාසිකාවෝ ද සිනා පහළ කළා දැක කාරණත් විචාරා නො පියා **සමණන්ට** '' මුන් වහන්සේ සිනාවක් **සී-පී සේක**.විද්දත් කමෙක් ඇති වනැ'' යි කිවු ය.

(අ) ඉහත පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත වචනවල අර්ථය වෙන වෙන ම ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 4×5= 20 )

03. 'උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව' මගින්, තරුණ පරපුරට තම ජීවිතවල සාර්ථක,අසාර්ථකභාවයට හේතු වන කරුණු රැසක් අනාවරණය කරයි.

(අ) උග්ගසේන සිටුපුත්ගේ චරිතයෙන්

(ආ) විද්දත් දියණියගේ චරිතයෙන් සුදුසු නිදසුන් දෙක බැගින් ගෙන ඉහත කියමන පැහැදිලි කරන්න.

**නැතහොත්**

'සැළලිහිණි සන්දේශ 'යෙහි පද්‍යාවලින්

(අ) චමත්කාරජනක වන පියසෙහි අසිරියත්

(ආ) සමාජ ආර්ථික තොරතුරුත් මනාව නිරූපණය කර ඇත.නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

04) බුදුරජාණන් වහන්සේ ' අඟුල්මල් දමනය' කළ අවස්ථාව කතුවරයා විස්තර කිරීමේ දී ,

(අ) පාඨකයාගේ සිතෙහි චිත්ත රූප මැවෙන ආකාරයත්

(ආ) යොදා ගත් භාෂා රීතියත්

අමාවතුර නිර්දිෂ්ට කොටසින් නිදසුන් දෙක බැගින් දක්වමින් පහදන්න.

**නැතහොත්**

'ගංගාවේ සංගීතය ' පැදි පෙළ නිර්මාණයේ දී කවියා,

(අ) අජීවී පරිසරයට සජීවී බවක් ආරෝපණය කිරීමටත්

(ආ) ගැඹුරු ජීවන දර්ශනයක් ඉදිරිපත් කිරීමටත් සමත් වී ඇත.එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 )

05. උම්මග්ග ජාතක කථාවෙහි සාර්ථකත්වයට එක් හේතුවක් වී ඇත්තේ ජාතක කතාකරු එහි යොදා ගත් භාෂා රීතිය ''යි.' සතර කන් මන්ත්‍රණය ' පාඩම ඇසුරෙන් නිදසුන් තුනක් දෙමින් පහදන්න.

06. හංස සන්දේශයේ 'කැරගල විහාර වර්ණනයෙන්' කවියා සතු ප්‍රතිභාපූර්ණත්වය මනාව පෙන්නුම් කරයි.සුදුසු නිදසුන් තුනක් ඇසුරෙන් උක්ත කියමන පහදන්න.

07. ''කුරහන් වගාවේ දී ගැමියා විඳින අසීමිත දුක් වේදනා සියුම් ලෙස ඉදිරිපත් කිරීම ' කුරහන් ඉසිමුව කළුවර බලාලා ' කවි පන්තියේ අරමුණ බව පෙනී යයි.'' නිදසුන් තුනක් දක්වමින් මෙම කියමන සනාථ කරන්න.

(ලකුණු 10 )